IHRA
UNIVERSITY OF COLOMBO

# මානව සම්පත් අභිවර්ධන ආයතනය

# කොළඹ විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## ශ්‍රම අධ්‍යාපනවේදී උපාධි පරීක්ෂණය - III කොටස - 2016/2017

(දෙවන සෙමෙස්තරය)

(පවත්වන ලද්දේ 2019 ජූනි)

## BLE 308 - ශ්‍රමයේ නූතන ප්‍රවනතා

**අයදුම්කරුවන්ට උපදෙස් :**

(1) මෙම ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න හතකින් (07) සහ පිටු තුනකින් (03) සමන්විතය. ඔබ විසින් පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න ගණන හයක් (06) වේ.

(2) ප්‍රශ්න අංක 01 ට අනිවාර්යයෙන් පිළිතුරු සැපයිය යුතුවේ.

(3) කාලය පැය තුනයි (03).

(4) පිළිතුරු පත්‍රයේ සියලුම පිටුවල විභාග අංකය යොදන්න.

(5) ප්‍රශ්න පත්‍රයේ යම් පිටුවක් හෝ කොටසක් පැහැදිලිව මුද්‍රණය වී නොතිබේ නම් කරුණාකර වහාම ඒ බව ශාලාධිපතිට දැනුම් දෙන්න.

01. i. "රැකියා වෙළඳපල සඳහා කාන්තාවගේ ප්‍රවේශය, ඔවුන්ගේ කුසලතා සංවර්ධනයටත් ගෘහ ආර්ථිකය නගා සිටුවීමටත්, රටක ආර්ථික වර්ධනයටත් බලපානු ලබයි." මෙම ප්‍රකාශය ශ්‍රී ලංකාවේ කාන්තා ශ්‍රමබල සහභාගීත්වය සහ එහි ප්‍රවනතා ආශ්‍රයෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 08)

ii. "ශ්‍රී ලංකා ආර්ථිකයේ විදේශ විනිමය මෙරටට පැමිණීමේ ඉහළම ප්‍රවාහය ලෙස විදේශ රැකියා නියුක්තිය හඳුනාගත හැක." මෙම ප්‍රකාශය ශ්‍රී ලංකා විගමනික ශ්‍රමිකයන්ගේ ප්‍රවනතා ඇසුරෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 08)

iii. "ගෝලීයකරණය (Globalization), ගෝලීය ශ්‍රම වෙළඳපලේ හැසිරීම කෙරෙහි බලපෑ ප්‍රධානතම සාධකයකි." මෙම ප්‍රකාශය සමග ඔබ එකඟ වන්නේද? ගෝලීය ශ්‍රම වෙළඳපලෙහි ඇතිවූ නව ප්‍රවනතා ඇසුරෙන් මෙම ප්‍රකාශය පහදන්න.

(ලකුණු 09)
(මුළු ලකුණු 25)

02. i. "ආයතනික සමාජ වගකීම්" සහ "සාධාරණත්වය" යනු කුමක්ද?

(ලකුණු 03)

ii. යුක්තිය හා සාධාරණත්වය ඔබ ආයතනය තුල ප්‍රවර්ධනය කිරීම උදෙසා අදහස් සහ යෝජනා ඉදිරිපත් කරන්න.

(ලකුණු 04)

iii. වර්තමාන සමාජය තුල දක්නට ලැබෙන සදාචාරාත්මක ගැටළු කවරේද? එම ගැටළු නිරාකරණය කරගැනීමට ආචාරධර්ම ඉවහල් වන්නේ කෙසේද? පහදන්න.

(ලකුණු 08)
(මුළු ලකුණු 15)

03. i. වැඩබිම තුල ශ්‍රමය සැපයීමේදී බියගැන්වීම, හිරිහැර කිරීම හා වෙනස්කම් කිරීම යන්න පැහැදිලි කරන්න.

(ලකුණු 03)

ii. බියගැන්වීමේ ප්‍රතිවිපාක කවරේද? කෙටියෙන් පහදන්න.

(ලකුණු 04)

iii. "වැඩබිම තුල හිරිහැරවලට නිරාවරණය වූ ශ්‍රමිකයන්ගෙන් වැඩිපිරිසක් කාන්තා ශ්‍රමිකයන් වේ." මෙම ප්‍රකාශය සමඟ ඔබ එකඟවේද? උදාහරණ දක්වමින් පහදන්න.

(ලකුණු 08)
(මුළු ලකුණු 15)

04. i. ආයතනික වැඩ නිරීක්ෂණය සඳහා යොදාගත හැකි ක්‍රමවේදයන් මොනවාද?

(ලකුණු 03)

ii. ආයතනික වැඩ නිරීක්ෂණ ප්‍රතිපත්තියක් හඳුන්වාදීමේදී ඇතිවිය හැකි ප්‍රායෝගික ගැටළු කවරේද? කෙටියෙන් පහදන්න.

(ලකුණු 04)

iii. ඔබ ඔබගේ ආයතනයේ ආරක්ෂක ප්‍රධානියා ලෙස, ආයතනික වැඩ නිරීක්ෂණ ප්‍රතිපත්තියක් සකස් කිරීමට ඔබට සිදුවී නම් ඒ සඳහා ඔබ ක්‍රියාකරන අයුරු පහදන්න.

(ලකුණු 08)

(මුළු ලකුණු 15)

05. i. චිත්තවේගීය ශ්‍රමය යනු කුමක්ද?

(ලකුණු 03)

ii. මතුපිට රංගනය සහ ගැඹුරු රංගනය අතර වෙනස කුමක්ද?

(ලකුණු 04)

iii. "චිත්තවේගීය ශ්‍රමය යහපත් ආයතනික කාර්ය සාධනයක් ඇතිකිරීමට බලපාන නමුත් සේවක සෞඛ්‍ය කෙරෙහි අයහපත් ප්‍රතිවිපාක ඇතිකරයි." මෙම ප්‍රකාශය සමග ඔබ එකගවේද? පහදන්න.

(ලකුණු 08)

(මුළු ලකුණු 15)

06. i. විවිධත්ව කළමනාකරණය යන්න නිර්වචනය කරන්න.

(ලකුණු 03)

ii. විවිධත්වය පිළිබඳ ප්‍රධාන මානයන් කවරේද?

(ලකුණු 04)

iii. "නිසිලෙස පාලනය වන සහ පූර්ණ වශයෙන් උපයෝගීකරගත් ආයතනික විවිධත්වය ඕනෑම සංවිධානයකට වත්කමකි." මෙම ප්‍රකාශය උදාහරණ යොදා ගනිමින් පහදන්න.

(ලකුණු 08)

(මුළු ලකුණු 15)

07.

i. සේවක රැකියා - ජීවිත සමබරතාව ඇතිවීම තුළින් රැකියා ආයතනයට ලබාගත හැකි ප්‍රතිලාභ කවරේද?

(ලකුණු 03)

ii. සේවක රැකියා - ජීවිත සමබරතාව කෙරෙහි බලපාන සාධක කවරේද? උදාහරණ යොදා ගනිමින් පහදන්න.

(ලකුණු 04)

iii. රැකියා නියුක්ත ශිෂ්‍යයකු ලෙස ඔබ රැකියා - ජීවිත සමබරතාව ඇතිකර ගැනීමට යොදා ගන්නා උපායමාර්ග කවරේද? පහදන්න.

(ලකුණු 08)

මුළු ලකුණු 15)

******